# පශ්චාත් යුද ආතතිය අවම කිරීම විෂයෙහි යුද හමුදා පුස්තකාල මගින් සිදුවන කාර්යභාරය විමර්ශනය කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින් තෝරාගත් යුද හමුදා මධ්‍යස්ථාන පුස්තකාලයන් ආශ්‍රිත අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**එන්. එම්. ඩබ්. ජේ. එම් නානායක්කාර[1]**
**ඩබ්.කේ.එම්.එම්.කේ වීරසිංහ[2]**

**සංක්ෂේපය**

කියැවීම ඔස්සේ නිර්මාණශීලී කලා කුසලතාවයන් ඔප් නැංවීමෙන් පශ්චාත් යුද ආතතිය දුරු කිරීමේ ලා යුද හමුදා සාමාජිකයන් විෂයෙහි යුද හමුදා පුස්තකාලයන්ගෙන් සිදුවන මෙහෙය කාලීන වශයෙන් ප්‍රමාණවත්ද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම පර්යේෂණය සතු ප්‍රධානතම ගැටළුව වේ.

විශේෂයෙන්ම, පර්යේෂකයාගේ පර්යේෂණ රාමුව තුළදී වඩාත් සැකෙවින් අවධානය යොමු කළ යුතු තත්වයක් වන්නේ "පශ්චාත් යුද ආතතිය" ඉස්මතු වීමේ ලා ප්‍රබලත්වයට බඳුන් වන මුඛ්‍ය සාධකය හඳුනා ගැනීමයි. යුද්ධය නිමාවූ කලියුගයේ, සාමාන්‍ය සිවිල් සමාජයට අනුගත වීමේදීත්, අනුයුක්ත කිරීමේදීත්, මුසු වීමේදීත් ක්‍රියා කලාපීයමය, සිතිවිළිමය වශයෙන් යම්කිසි ඝට්ඨනාත්මක තත්වයක් නිර්මාණය වීමේ ලා පුථුල ඉඩ කඩක් පවතී. පශ්චාත් යුද ආතතී තත්වාකාරයන් හඳුනා ගනිමින් යුද හමුදා සාමාජිකයන් තුළ පැවතිය හැකි පශ්චාත් යුද ආතතිය අවම කිරීම සඳහා ගත හැකි එක් සාධිකාරී පියවරක් නම්, ඔවුන්ව පුස්තකාල භාවිතය සඳහා යොමු කර වීමය. ඒ ඇසුරෙහිදී, ඔවුනොවුන් විෂයෙහි නිසඟවම කියවීමට යෝග්‍යය පුස්තකාල සැළැස්මක් පවතින්නේදැයි යන්න අධ්‍යයනය කිරීම, සීමිත කාලය කළමනාකරණය කරගන්නා ආකාරය අධීක්ෂණය කිරීම, පොත් පත් කඳවුරු තුළින් බැහැරට ගෙනයාම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුනා ගැනීම, විස්තෘත සේවාවන් හාතාක්ෂණිකමය අවබෝධය,යුද හමුදා සාමාජිකයන් සතු එකිනෙකින් අවිචල්‍යය දැණුම් මට්ටම්/ අවබෝධාත්මක රටාවන් හා මානසික සැකැස්මේ විවිධත්වයන්ට සාපේක්ෂව ප්‍රමාණවත් එකතුවක් ස්ථාවරව පවතින්නේදැයි යන්න හඳුනා ගැනීමට ඉහළ අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

පනාගොඩ සහ කැළණිමුල්ල යන යුද හමුදා කඳවුරු ද්විත්වය යටතේ සමස්ත සංගහනය 62 ක් වන අතර, කඳවුරු සාමාජිකයන් 52 ක් හා යුද පුස්තකාල පරිපාලකයින් 10 වශයෙනුත් පර්යේෂණය විෂයෙහි පාත්‍ර විය. පශ්චාත් යුද ආතතී මට්ටම් නිර්ණය, කියවීමේ කැමැත්ත, පුස්තකාල පහසුකම් හා සේවා, කඳවුරු පුස්තකාල වෘත්තිකයන් සතු කැපවීම, අධ්‍යාපනික මට්ටම ආදී පැතිකඩයන් අළලා ප්‍රශ්නාවලිය සම්පාදනය කෙරිණි. ආධුනික සෙබළ නිළයෙහි සිට ලුතිතන් කර්නල් නිළය දක්වා වන පිරිස් කඳවුර තුළ සිටින්නා වූ සාමාජික සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක භාවය මත සහභාගී කර ගත් අතර සහභාගී නිරීක්ෂණ ක්‍රමය, ප්‍රශ්ණාවලී ක්‍රමය, ඉතිහාසාත්මක වාර්තා, විශ්ලේෂණය, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ආදියද ඇතුළුව යුද හමුදා කඳවුරු/ ආයතනයන් සතු දත්තයන් ද පර්යේෂකයා සිය පර්යේෂණ ක්‍රමවේදය විෂයෙහි උපයෝගී කර ගන්නා ලදී.

**ප්‍රමුඛ පදඃ පශ්චාත් යුද ආතතිය,මානසික ආතතිය, යුද වෙහෙස, යුද පුස්තකාල, විශේෂ පුස්තකාල,ආරක්ෂක පුස්තකාල**

---

*1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* jananinanayakkara777@gmail.com

2. *මහාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* waw@kln.ac.lk